**ශීර්ෂය 103 ආරක්ෂක අමාත්‍යාංශය**

--------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

ආරක්ෂක අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේදයට යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| ------------------ | ---------------------- | ----------- |

| | | |
|---|---|---|
| 2.1.3 (අ) | අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (05) ඡේදය හා මුදල් රෙගුලාසි 128(2)(එ) හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හි ආර්ථික තත්වයේ වෙනස්කම් සැළකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපිව සංශෝධනය කළ යුතු වුවත් 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කිරීම සමාලෝචිත වර්ෂය තුළදීද සිදු කර නොතිබුණි**.** | චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.6.1. ආදායම් ලැබීම්
-----------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------------------------- | ----------- |
| මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 1/2015 දරණ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන හිඟහිටි බලපත්‍ර ගාස්තු ආදායම සහ මූල්‍ය ප්‍රකාශනයෙහි ACA - 1(i) ආකෘතියෙහි හිඟ හිටි ආදායම අතර රු.512,200 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම ACA – 1(i) ආකෘතියෙහි දක්වා නොතිබීම මෙම වෙනසට හේතුවී තිබුණි. | 2019 දෙසැම්බර් .31 දිනට පැවති හිඟ ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇති අතර, අතපසු වීමකින් 2018.12.31 දිනට අදාළ ව පැවති හිඟ ශේෂය මේ සඳහා එකතු කර නොමැත. ඉදිරියේ දී පෙර වර්ෂයන්හි හිඟ ශේෂයන් ද එකතු කර මෙම අගය ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.2 මූල්‍ය නොවන වත්කම්
--------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------------------- | ------------ |
| (අ) | 103-01-01-2103 වැය විෂය යටතේ අමාත්‍ය කාර්යාලය - යන්ත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් සලසා තිබූ රු.25,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.24,340,905 ක් ජනාධිපති ආරක්ෂක අංශය සඳහා ගිනිඅවි මිලදී ගැනීම වෙනුවෙන් | මෙම වත්කම් 2021 වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනීමක් ලෙස වත්කම් කළමනාකරණ වැඩසටහනට ඇතුලත් කර ඇත. කෙසේ වෙතත් එම වත්කම්වල හිමිකම ශ්‍රී ලංකා යුද හමුදාවට පවරා දීමට කටයුතු කර ඇත. | වෙනත් වැය ශීර්ෂයන්ට අදාල වත්කම් මිලදීගැනීම සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හා මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත නිවැරදිව දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැයකර තිබුණි. මෙම මිලදී ගැනීම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලසුමට හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුලත්ව නොතිබුණු අතර මිලදී ගැනීමෙන් අනතුරුව මෙම ගිනි අවි ශ්‍රී ලංකා යුදධ හමුදාව වෙත පවරා දී තිබුණු නමුත් එම උපකරණ අමාත්‍යාංශ වත්කම් අත්පත්කර ගැනීම් යටතේ දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල පිරියත හා උපකරණ රු.24,340,905 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂය තුල එම වත්කම් වටිනාකම, අමාත්‍යාංශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකමින් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර, එම වත්කම්වල වටිනාකම යුද හමුදාවේ වත්කම් කළමනාකරණ වැඩසටහනට ඇතුලත් කිරීමට අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා යුද හමුදාව වෙත ලබාදීමට කටයුතු කර ඇත. | |
| (ආ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. 27,508,087,238 ක් වූ අතර 2021 මූල්‍ය ප්‍රකාශන අනුව 2021 ජනවාරි 01 දිනට පැවති ආරම්භක ශේෂය රු. 27,642,454,195 ලෙස දක්වා තිබුණි. ඒ අනුව ශේෂය ඉදිරියට ගෙන ඒමේදී රු. 134,366,957ක වැඩිවීමක් නිරීක්ෂණය විය. 2020 වර්ෂයට අදාල ගැලපුම් 2021 වර්ෂය තුල සිදුකිරීම මෙම වැඩිවීමට හේතුවී ඇති බව දක්වා ඇතත් ආරම්භක ශේෂයට සිදුකළ ගැලපීම් පිළිබඳව ගිණුම් මගින් අනාවරණය කර නොතිබුණි. | මෙම වැඩි වීම සඳහා වන ගැළපීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නො තිබුණු අතර, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී මෙවැනි ගැළපීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කරනු ඇත. | ආරම්භක ශේෂය නිවැරදි විය යුතු අතර ආරම්භක ශේෂයට කරන ලද ගැලපීම් අනාවරණය කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාර **SA** 82 වගුවට අනුව 2021 ජනවාරි 01 දිනට දැක්වෙන ස්ථාවර වත්කම් වල ආරම්භක ශේෂයට රු. 20,324,727 ක වත්කම් ගැලපුම් කර තිබුණද මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ආරම්භක ශේෂයට රු.134,366,957 ක වත්කම් එකතු කර තිබුණි. ඒ අනුව රු.114,042,230 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ SA 82 වගුවේ සටහන් ව ඇති නමුත් මූල්‍ය ප්‍රකාශනවල ACA 6 ආකෘතිය සකස් කිරීමේ දී අතපසුවීමකින් රු. 101,460,000 ක් ආරම්භක ශේෂයට ඇතුලත් කිරීමෙන් 2021 ආරම්භක ශේෂයේ ඉහළ යෑමක් සිදු වී ඇත. එසේම 2021 වර්ෂයට පෙර අත්පත් කර ගත් නමුත්, මාර්ග ගත ක්‍රමය ඔස්සේ වත්කම් කළමනාකරණ වැඩසටහනට ඇතුලත් කිරීමට පහසුකම් සලසා දී නො තිබුණු රු. 12,586,987 ක වටිනාකම ඇතුලත් කර ඇති බැවින් 2021 ආරම්භක ශේෂය ඉහල යෑමක් සිදු වී ඇත. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් භාණ්ඩාගාර ශේෂයන් සමග සසඳා ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය(**ACA-6** ආකෘතිය)අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් අගය රු. 8,031,748,960 ක් ලෙස දක්වා තිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එම අගය රු.8,288,156,006 ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 256,407,046 ක වෙනසක් නිරූපනය විය. | යුධ හමුදාව විසින් 103-01-02-2104 වැය විෂය යටතේ ගිණුම් ගත කරන ලද ඔයාමඩුව පතොරම් ගබඩාව සඳහා දරණ ලද එහෙත් අමාත්‍යාංශයේ වත්කම් වශයෙන් ගිණුම් ගත නොකරන ලද වටිනාකම රු.269,521,433 ක් වන අතර, 2022 වර්ෂයේ මැයි මස ගිණුම් සාරාංශ මඟින් ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත.<br>2020 වර්ෂයේ දෙසැම්බර් මිල දී ගන්නා ලද නමුත් 2021 වර්ෂයේ දී වත්කම් කළමනාකරණ වැඩසටහනට මිල දී ගැනීම් ලෙස ඇතුළත් කරන ලද වටිනාකම රු.27,378,115 ක් වේ. ඒ හේතුවෙන් මෙම අගය 2021 ලෙජරයට අනුව මිල දී ගත් වත්කම් වල වටිනාකමට වඩා වැඩි අගයක් ලෙස පෙන්නුම් කෙරේ.<br>රු. 14,263,728 ක වත්කම් 2021 මිල දී ගැනීම සිදුකර ඇති අතර, එම අගය වත්කම් කළමනාකරණ වැඩසටහනට ඇතුලත් කර නැත. | -එම- |
| (ඉ) | භාණ්ඩාගාර SA 82 වගුවට අනුව මූල්‍ය නොවන වත්කම් අවසාන ශේෂය රු. 37,724,115,329 ක් වූ අතර ACA 6 ආකෘතියට (මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය) අනුව ශේෂය රු 36,714,333,377 විය. ඒ අනුව රු.1,009,781,952 ක් වෙනසක් නිරීක්ෂණය විය. | CIGAS වැඩසටහන තුළ මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීමේ දී රු.1,009,781,952 ක වත්කම් දෙවරක් ගිණුම් ගත කර ඇත. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ද උපදෙස් මත 2022 ජූනි මස ගිණුම් සාරාංශය මඟින් මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු සූදානම් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි තොරතුරු ඉදිරිපත් කල යුතුය. |

1.6.3 මූල්‍ය වත්කම්

------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------- | -------------------------------- | --------------------- |
| (අ) | අමාත්‍යාංශයට අයත් බැංකු ගිණුම් දෙකක් වෙත ඍජු තැන්පතු ලෙස ලැබී තිබුණු රු.3,037,257ක් හඳුනානොගත් තැන්පතු ලෙස දක්වා තිබුණු අතර එම තැන්පතු නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2021 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය තුල රු.2,946,346.90 ක මුදලක් හඳුනා නොගත් තැන්පතු ලෙස සටහන් වී ඇත. බාහිර පාර්ශවයන් විසින් විවිධ සේවාවන් උදෙසා තැන්පත් | හඳුනානොගත් තැන්පතු අප්‍රමාදව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | කරන මුදල් හඳුනා ගෙන කඩිනමින් ගිණුම් ගත කිරීමට ඒ ඒ අංශ දැනුවත් කර ඇත. | |
| (ආ) ජාතික ශිෂ්‍යබට බලකායේ බැංකු ගිණුමට අදාල සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ තැන්පතු යටතේ රු.2,961,138 ක ශේෂයක් දක්වා එය මුදල් පොතේ දෝෂයක් ලෙස සඳහන් කර බැංකු සැසඳුම පිලියෙල කර තිබුණි. එම දෝෂය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ අනුව මුදල් පොතේ දැක්වෙන ශේෂය බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය සමඟ සැසඳී නොතිබුණි. | 2022 ජනවාරි මස බැංකු සැසඳුම් ප්‍රකාශය මඟින් හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. | බැංකු ගිණුමට අදාල සැසඳුම් ප්‍රකාශය පිලියෙල කර අදාල නිවැරදි කිරීම් කර ගත යුතුය. |

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ විවිධ අංශ විසින් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය /ගබඩා භාණ්ඩ අයදුම් කරමින් ගබඩාව වෙත ඉදිරිපත් කර තිබුණු 2021 ඔක්තෝබර් මාසයට අදාල ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකා ගොණුව විගණන පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොවුණි. එබැවින් එම කාලය තුළ නිකුත්කළ තොග පිළිබඳව පරීක්ෂාකළ නොහැකි විය. තවද සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුල තොග පොත් වල ඇතුලත්ව තිබුණු නිකුත් කිරීම් ඒ ඒ මාසය තුල සිදුකල සියළුම නිකුත් කිරීම් වල එකතුවක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් නිකුත් කිරීම් වල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකිවිය. | 2021 ඔක්තෝම්බර් මාසයට අදාළ ද්‍රව්‍ය අධියාචනා පත්‍ර ගොනුව ගබඩා භාර කරු අතින් අස්ථාන ගත වී ඇති බැව් ගබඩා භාරකරු විසින් පිළිගෙන ඇති අතර, ගබඩා පාලනයට අදාළ ව අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය කිරීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | නිසි තොග පාලන පිළිවෙත් අනුගමනය කිරීම හා විධිමත් සුපරීක්ෂණයක් පවත්වා ගත යුතුය. |

1.6.5 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යංශය විසින් සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු පිරිවැය රු. 6,489,796 ක්වූ පාරිභෝජ්‍ය භාණ්ඩ වර්ග 6කට අදාලව කිසිදු තොග ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ටෝනර් වර්ග 143 ක් හා ලිපි ද්‍රව්‍ය අයිතම 12 ක අදාලව තොග පොත් (පොදු 198) පවත්වා නොතිබීම හෝ තොග පොත් යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් භෞතික තොග ශේෂය, තොග පොත් අනුව දැක්වෙන ශේෂය සමඟ අර්ථාන්විත සැසඳීමක් කල නොහැකිවිය. | තොග ලේඛන නිසි පරිදි පවත්වා ගෙන යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇති අතර, ඉදිරියේ දී මේ පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණ හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු පරීක්ෂණ සිදු වන බැවින් ඒ පිළිබඳව හෙළිදරව් වන කරුණු මත ගබඩා භාර කරුට එරෙහිව අදාළ නීතිමය පියවර ගනු ලැබේ. | තොග ලේඛන නිසි පරිදි පවත්වා ගෙන යාවත්කාලීන කිරීමට කටයුතු නල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ආදායම් සංකේතාංක 20.03.06.00 - යටතේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් වලින් 2021 දෙසැම්බර් 31 දිනට එ.ජ. ඩොලර් 9,954,775 ක හිඟ ආදායමක් පැවති අතර එයින් එ.ජ. ඩොලර් 2,092,466 ක් වසරකට වැඩි කාලයක සිට හිඟහිට පැවතුණි. | 2021.12.31 දිනට හිඟ ආදායමින් එ.ජ. ඩොලර් 2,947,445 ක් අයකර ගෙන ඇති අතර, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පවත්වනු ලබන උපකරණ පරීක්ෂාවේ දී උපකරණ නිසි ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබීම මත ආදායම අඩු කිරීම/කපා හැරීම් සිදු වන බැවින් ඇස්තමේන්තු ගත හිඟ ආදායම වෙනස් වීමට ලක් වන බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් දන්වා ඇත.<br>එසේම මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධාන දැනුවත් කර ඇති බව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ද දන්වා ඇත. | හිඟ ආදායම් කාලීනව අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුපුරණ ද්‍රව්‍ය හා අනෙකුත් ගාස්තු ආදායමෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.1,920,650 ක් හිඟ හිටිව පැවති අතර එයින් රු.864,800 ක් වසර දෙකකට වැඩි කාලයක සිට හිඟහිට පැවතුණි. | 2021.12.31 දිනට හිඟ හිටි ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් එසේ හිඟ ආදායම් අයකර ගැනීමට නොහැකි ගිනි අවි බලපත්‍ර සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කිරීමට හා ඒ සම්බන්ධව ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විමසීම සඳහා කටයුතු කර ඇත. තවද, මෙම හිඟ ආදායම් අයකර ගැනීමේ වර්තමාන ප්‍රගතිය අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. | -එම- |
| **(ඇ)** | ආදායම් සංකේතාංක 2003.06.00 - එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් ආදායමට අදාලව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ 2021 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.4,208,140,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයෙහි **ACA – 1(ii)** ආකෘතියෙහි එම වටිනාකම රු.4,300,000,000 ලෙස දක්වා තිබුණි. මේ නිසා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ මූල්‍ය ප්‍රකාශනයෙහි **ACA – 1(ii)** ආකෘතියෙහි දැක්වෙන වටිනාකම අතර රු.91,860,000 ක වෙනසක් නිරූපනය විය. | 2021 වර්ෂයට අදාළ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.4,280,140,000 ක් වුවත් අයවැය දෙපාර්තමේන්තුව මඟින් 2022 වර්ෂයට නිකුත් කල අයවැය ඇස්තමේන්තුවෙන් අනුමත වු මුදල රු.4,300,000,000 ක් වන බැවින් මූල්‍ය ප්‍රකාශනයේ ACA – 1(ii) ආකෘතියෙහි සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ලෙස එම මුදල සටහන් කර ඇත. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුයි. |

**2.2** **වියදම් කළමනාකරණය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් 19ක් සඳහා සලසා තිබුණු එකතුව රු.652,684,900 ක ප්‍රතිපාදනද, පුනරාවර්තන වැය විෂයයන් 20 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 217,599,602ක ප්‍රතිපාදනද | කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ අපේක්ෂිත කාර්යයන් නිම කිරීමට නො හැකි වීමෙන් වියදම් සීමා වීම මෙයට හේතු විය.. | මුදල් රෙගුලාසි 50(**ii**) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉතිරිවී පැවතිණි. තවද මු. රෙ. 66 යටතේ රු.113,987,000 ක් වෙනත් වැය විෂයන්ට මාරු කිරීමෙන් අනතුරුවද මෙම පුනරාවර්තන වැය විෂයයන්ගේ ඉතිරිවීම පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. මෙම ඉතිරිවීම් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 25 ත් සියයට 99 ක් අතර පරාසයක පැවතිනි. | | |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සලසාගෙන තිබූ රු. 157,500,000 ක පරිපූරක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. එසේම තවත් එක් ප්‍රාග්ධන වැය විෂයක් සඳහා සලසා ගෙන තිබූ රු. 131,000,000 ක පරිපූරක ප්‍රතිපාදනෙයන් 86% ක් හෙවත් රු. 112,208,353 ක් ඉතිරිවී තිබුණි. | -එම- | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන පරිපූරක ඇස්තමේන්තු සකස් කල යුතුයි. |
| (ඇ) | වැය විෂයන් 22 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 17,450,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | අමාත්‍ය කාර්යාලය සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් අනුයුක්ත නොකිරීම. | -එම- |
| (ඈ) | පුනරාවර්තන වැය විෂයයන් 02 කට අදාල සම්පූර්ණ ප්‍රතිපාදනයවූ රු. 4,600,000 ක් මු.රෙ. 66 ප්‍රතිපාදන අනුව වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. | මෙහෙයුම් කල්බදු පොළිය ගෙවීම් අවසන් වී වාරික පමණක් ගෙවීමට තිබූ අතර, ඒ අනුව අවශ්‍යතාවයක් පැන නොනැගිණි. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ විදෙස් පාඨමාලා හා පුහුණු වැඩසටහන් නොපැවැත් වූ බැවින් ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකි විය. භාණ්ඩාගාරයේ අනුමැතිය ඇති ව අත්‍යාවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා මු.රෙ.66 මඟින් ප්‍රතිපාදන මාරු කර ගන්නා ලදී. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්,නිවැරදිවත් පිළියෙල කල යුතුය. |
| (ඉ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වැය විෂයන් තුනකට සලසා තිබුණු රු.18,000,000 ප්‍රතිපාදනය මෙන් දෙගුණයකට අධික ප්‍රතිපාදන හෙවත් රු. 42,078,000 ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයන්ගෙන් මාරු කර ගෙන තිබුණි. | 2021 වර්ෂය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවූ වැයවිෂයන් තුනක් වෙත ප්‍රතිපාදන ඉතිරි වේ යැයි අපේක්ෂිත වැය විෂයන් වෙතින් මු.රෙ. ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රතිපාදන මාරු කිරීමේ දී නිසි කළමනාකරනයකින් යුතුව සිදුකල යුතුය. |

## 2.3 අතාත්වික සීමා පැනවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2021 අයවැය ඇස්තමේන්තු මගින් පනවා තිබූ අවම ලැබීම් සීමාව රු. 223,000,000 ක් වුවද තථ්‍ය ආදායම රු. 79,227,522 ක් වූයෙන් අවම ලැබීම් සීමාව ලඟාවී නොතිබුණු අතර අවම ලැබීම් සීමාව තථ්‍ය ආදායම සමඟ සැසඳීමේදී අතාත්වික බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුව අවම ලැබීම් සීමාව රු.මි.45 ක් ලෙස දක්වා ඇතත් අයවැය දෙපාර්තමේන්තුව මඟින් මෙම සීමා අනුමත කර ඇත. | තාත්වික සීමාවන් පැනවීමට කටයුතු කල යුතුය. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සටහන් අංක (iii) හා (iv) අනුව 2021 දෙසැම්බර් 31 දිනට පැවති බැඳීම් හා බැරකම් වල එකතු වටිනාකම රු.2,287,685,069 ක් ලෙස දක්වා තිබුණු අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැරකම් ප්‍රමාණය රු. 1,218,883,761 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපනය වන බැඳීම් හා බැරකම් ප්‍රමාණය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැඳීම් හා බැරකම් ප්‍රමාණය අතර රු. 1,068,801,308ක වෙනසක් නිරීක්ෂණය විය. | වර්ෂ අවසානයේ ආරක්ෂක හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ පැවති බැර කම් හා ත්‍රිවිධ හමුදාව විසින් අමාත්‍යාංශ වැය ශීර්ෂයට ඇතුලත් කළ බැරකම් සිගාස් වැඩසටහනට යාවත්කාලීන කිරීමේ දී පැවති තාක්ෂණික ගැටළුවක් මත මුළු වටිනාකමින් යම් ප්‍රමාණයක් යාවත්කාලීන වී නොමැත.<br>මෙකී තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කිරීමටත්, කාර්ය මණ්ඩලය වෙත නිසි පුහුණුවක් ලබා දීමටත් කටයුතු කරමින් සිටී. | භාණ්ඩාගාර පරිගනක මුද්‍රිත සටහන් සමග සැසදීම් කර නිවැරදි වටිනාකම් දැක්විය යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 94 අනුව වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදන සලසා ඇත්නම් විනා වැඩක්, සේවාවක් සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු බව දක්වා ඇති අතර 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය | විසර්ජන ඇස්තමේන්තුව මඟින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාව තුල වියදම් කළමනාකරණයටත්, බැර කම්වලට එළඹීමටත් ඇති වග වීම පිළිබඳව අදාළ වැයවිෂය භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි හා අදාල චක්‍රලේඛ පරිදි කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව යම් මුදල් වර්ෂයකට අදාළ සියලුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කල යුතුය. කිසිදු බැරකමක් ඊළග මුදල් වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතුව ඉදිරියට ගෙන නොයා යුතු බවද සදහන් වේ. එසේ වුවත් අමාත්‍යාංශය විසින් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් 4කට අදාළව රු. 4,216,773 ක බැරකම් වලට බැඳී තිබෙන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | 2022 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසයන්හි ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂණයේදී 2021 වර්ෂයට අදාළ එකතුව රු. 8,590,715 ක් වූ වියදම් 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.8,590,715 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශයට සම්බන්ධ සමහර ආයතන විසින් බැරකම් වාර්තා නිසි පරිදි යාවත්කාලීනව ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොවූ බැරකම් පසුව ගෙවීම සඳහා ඉදිරිපත් වි ඇත. මෙම තත්ත්වය ඉදිරියේදී වලක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | බැරකම් නිසි ලෙස හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුයි. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ<br>මුදල් රෙගුලාසි 384 හා 390 | මුදල් රෙගුලාසි මගින් දැක්වෙන පාලන පිලිවෙත් කෙරේ අවධානය යොමු කරමින් චෙක්පත් භාවිතා කලයුතු වුවත් ජාතික ශිෂ්‍යභට බලකාය විසින් | ඉදිරියේ දී විගණනය මඟින් පෙන්වා දී ඇති මෙම අඩුපාඩු මඟ හරවා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අපරීක්ෂාකාරී ලෙස චෙක්පත් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | මුදල් රෙගුලාසි 715(2) | අමාත්‍යාංශයේ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාව විසින් මුදල් රෙගුලාසිවලට පටහැනිව නිසි අනුමැතිය රහිතව භාණ්ඩ නිකුත්කර තිබුණු අවස්ථා හා තොග පාලන පිළිවෙත් අනුගමණය නොකළ අවස්ථා නියදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ගබඩාව සම්බන්ධව අභ්‍යන්තර පාලන පද්ධතියට අදාළ වෙනස්කම් හා දැනුවත් කිරීම් සිදුකිරීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඇ) | මුදල් රෙගුලාසි 715 (3) | ගබඩා නිලධාරීන් විසින් ගබඩා භාරකරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීම, ගබඩා භාරකරුවන්ගේ වාර්තාවල, රෙජිස්ටර්වල සහ ගිණුම් වල හරිවැරදි බැලීම හෝ ඔවුන් වෙත ඇති තොගවල හරිවැරදි බැලීම සිදු කලයුතු වුවත් අමාත්‍යාංශයේ පාරිබෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාව හා ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථාන ගබඩාව සම්බන්ධයෙන් එවැනි අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පවත්නා කාර්ය බහුලත්වය මත යම් අතපසු වීම් සිදු වී ඇති නමුත් එම තත්ත්වය මඟ හරවා ගනිමින් නිසි අධීක්ෂණයක් හා පාලනයක් සිදු කළ හැකි වන පරිදි අධීක්ෂණ නිලධාරීන්ගේ රාජකාරි කටයුතු සංශෝධනය කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළයුතුය. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ- අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 3.1 ජේදය | නිශ්චිත කාලසීමාවක් හෝ ධාවන කිලෝමීටර් සංඛ්‍යාව හෝ අළුත්වැඩියාවන් පදනම්කර ගනිමින් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකල යුතු අතර ඉන් අනතුරුව ඒ ඒ වාහනයේ ඉන්ධන භාවිතය පිළිබඳ තොරතුරු ඇතුළත් ආකෘතියක් මත සටහන් පවත්වා ගත යුතු වුවත්, අමාත්‍යාංශයේ හා ජාතික ශිෂ්‍යභට බලකායේ වාහන සම්බන්ධයෙන් එවැනි ඉන්ධන පරීක්ෂාවක් හෝ ලේඛණ පවත්වාගැනීමක් සිදුකර නොතිබුණි. | අමාත්‍යාංශයේ රථ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාව ආරම්භ කරඇත. ජාතික ශිෂ්‍යභට බලකායේ සියළුම රථ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාවට උපදෙස් ලබා දී ඇත රථ වාහන 36 ක් පරීක්ෂණයට භාජනය කර ඇත. | අදාල චක්‍රලේඛ පරිදි කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | අංක 02/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ජේදය | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචිය අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරා දීමට හෝ එහි දැක්වෙන අනෙකුත් උපදෙස් මත කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය හා ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් භාවිතා කරනු ලබන වාහන 36 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | අදාල චක්‍රලේඛ පරිදි කටයුතු කල යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය-4.2.3 වගන්තිය. | ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සපයා ස්ථාපනයකිරීම පිළිබද ප්‍රසම්පාදනයට අදාලව කෙටුම්පත් ලංසු ලේඛණ පරීක්ෂාවේ සිට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්නය කිරීමේ අධියර දක්වා අනුමත කාලය දින 147 ක් වුවත් ඒ සදහා දින 306 ක් ලබා ගැනීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් අතිරේක දින 159 ක කාලයක් වැයකර තිබුණි. | කෙටුම්පත් ලංසු ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2021.02.16 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර එය පරීක්ෂා කිරීමෙන් පසු එලබි පලමු අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) වෙත 2021 මාර්තු මස 04 ඉදිරිපත් කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතුය. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත් දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 395 (ඇ) පරිදි බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් | මේ වන විට 2020 හා 2021 වසර වල මුදල් පොත් හා වවුචර් නැවත පරීක්ෂා කරමින් බැංකු සැසදුම් ප්‍රකාශ සකස් කිරීම | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඊලඟ මාසයේ **15** වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවත් ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත පරිදි පිළියෙල කර හෝ සහතික කර හෝ නොතිබුණි. | ආරම්භ කර ඇත. | |
| (ආ) | ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය විසින් නිකුත් කල නමුත් මාස 6 කට වැඩි කාලයක් තුල ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.7,098,659 ක් වටිනා චෙක්පත් 53 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කර නොතිබුණි. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරියේ දී සිදු නො වීමට අවශ්‍ය පියවර සටහන් කර ගන්නා ලදී. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මත සලසා ඇති ප්‍රතිපාදනය රු. මිලියන 10,000 ක් වුවත් අමාත්‍යාංශය විසින් පිළියෙලකර තිබුණු 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රමුඛතා අදියර 08 ක් යටතේ පිරිවැය රු. මිලියන 17,848 ක්වූ ප්‍රසම්පාදන කාර්යන් 404 ක් සැලැසුම්කර තිබුණි. කෙසේ වෙතත් මෙම සැලැසුම් වාර්ෂික අයවැය ප්‍රතිපාදනය පදනම්කර ගනිමින් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදාළ අංශය වෙතින් මෙම නිරීක්ෂණය සඳහා වන කරුණු දැක්වීම් ඉදිරිපත් කල පසු කඩිනමින් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ඇස්තමේන්තු මත සලසා ඇති ප්‍රතිපාදනය සැලකිල්ලට ගෙන කටයුතු කල යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ප්‍රමුඛතා අදියර 02 සිට 07 යටතේ වන කොන්ත්‍රාත් කාර්යන් 275 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගැනීමට සැලැසුම්කර තිබුණු නමුත් 2021දෙසැම්බර් 31 දිනට එම කොන්ත්‍රාත් කාර්යයන්ගෙන් කාර්යයන් 85 ක් කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර කාර්යයන් 58 ක ප්‍රගතිය සියයට 1 ක් 30 ත් අතර පහල අගයක පැවතුණි. | අදාළ අංශය වෙතින් මෙම නිරීක්ෂණ සඳහා වන කරුණු දැක්වීම් ඉදිරිපත් කල පසු කඩිනමින් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සැලසුම් කල පරිදි අපේක්ෂිත කාර්යසාධනය ලගාකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | උපාය මාර්ගික ආරක්ෂක සංනිවේදන ජාල ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව 2016 වර්ෂය අවසන් වනවිට ඉදිකිරීම් අවසන් කිරීමට යෝජිතව පැවතියද ව්‍යාපෘති කාලසීමාව වර්ෂ 06 කින් දීර්ඝකර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පැවති සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 73 ක සහ සියයට 53 ක් වශයෙන් පැවති අතර ව්‍යාපෘතිය සැලසුම්ගත කාලපරාසයන් තුළ අවසන් නොවීම හේතුවෙන් එමගින් අපේක්ෂිත සන්නද්ධ සේවා අතර ඒකාබද්ධ උපාය මාර්ගික සංනිවේදනය පවත්වාගැනීමේ මූලික අරමුණ කාලීනව ඉටුකර ගැනීමට තවදුරටත් ප්‍රමාදවෙමින් පැවතුණි. | මෙම ව්‍යාපෘතිය 2014 සිට 2016 දක්වා කාලය තුල අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද කුළුණු ඉදි කිරීම පමාවීම, මයික්‍රෝ තරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධතිය ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීමේ ටෙන්ඩරය නැවත කැඳවීමට සිදුවීම හේතුවෙන් 2022.12.31 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කරන ලදී. | -එම- |
| (ඇ) | ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර අවස්ථා කීපයකදී කැඳවන ලද ලංසු අවලංගු කර තිබුණි. 2021 ජනවාරි 11 දින ප්‍රසම්පාදන කාර්යයන් නැවත අරඹා ඇතත් 2021 දෙසැම්බර් 31 වනවිටත් එම කාර්යන්ද ප්‍රසම්පාදන අභියාචනා කමිටු අදියරේ පැවැතිණි. මේ අනුව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වර්ෂ 05 ආසන්න කාලයක් ගතවී තිබුණු අතර එය | නැවත ලංසු කැඳවීම අභියාචනා ක්‍රියාවලියට යොමු වූ බැවින් අනපේක්ෂිත කාලයක් වැය විය. අභියාචනා ක්‍රියාවලිය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරි පත් කිරීමට නියමිත ව තිබුණ ද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව වියදම් පාලන ක්‍රමවේදයන් අනුගමනය | සැලසුම් කල පරිදි කොන්ත්‍රාත් කාර්යයන් ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති ප්‍රමාදය කෙරෙහි සෘජුවම බලපා තිබුණි. | කළයුතු විය. | |
| (ඇ ) | ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 38.54 ක් වැයකර මිලදීගෙන ස්ථාපනය කර තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් සමගාමී ක්‍රියාවන්ගේ ප්‍රමාදය හේතුවෙන් අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකිව වර්ෂ දෙකකට ආසන්න කාලයක් තුළ නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 562.16 ක් වැයකර 2020 වර්ෂයේදී නිමකර තිබුණු සන්නිවේදන කුළුණු 11 සහ එයට සම්බන්ධිත උපාංග මැදිරි තවදුරටත් අදාල ව්‍යාපෘති අරමුණු සඳහා උපයෝගී කර ගැනීම ප්‍රමාද වෙමින් පැවැති අතර කුලුණුවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා 2022 වර්ෂයේ රු.මිලියන 05 ක වියදමක් දැරීමට අපේක්ෂිත විය. | කුළුණු වලින් බොහොමයක් මේ වන විට ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා විශේෂ කාර්යය බලකායේ සන්නිවේදන අවශ්‍යතාවයන් සඳහා භාවිතා වන අතර ඇතැම් කුළුණු ජංගම දුරකථන සේවාවන් සපයන්නන් වෙත කුලී පදනම මත ලබා දී ඇත. | සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය අවසන්කර අපේක්ෂිත අරමුණ සඳහා යෙදවීමට කටයුතු කළයුතුය. |

3.3 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------------- | ------------ |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ), 7.7 සහ 8.9.1 (ආ) යන ඡේදයන්හි දැක්වෙන නියමයන්ට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ සලකා බැලීමකින් තොරව පරිගණක මිලට ගැනීම සහ වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ සැපයුම් කොන්ත්‍රාත්තු සඳහා ගිවිසුම් ලියා අත්සන් නොකිරීම් වැනි අවස්ථා පැවති බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. | පරිගණක මිල දී ගැනීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන අනුව රාජ්‍ය ආයතනයකින් සෘජුව මිල දී ගෙන ඇත. නිවසේ සිට රාජකාරි කිරීම හා ආහාර ආවේක්ෂණ හා ප්‍රසම්පාදන රාජකාරි සඳහා කඩිනමින් මිල දී ගත යුතු බැවින් හා වෙළඳපොළ තුල පරිගණක හා උපාංග වල දැඩි හිඟයක් පැවති බැවින් එම ප්‍රසම්පාදනය සිදු කර ඇත. වසංගත තත්ත්වය යටතේ නිලධාරීන් පැමිණීමම සීමා කිරීම නිසා රු.500,000 ඉක්මවන සෑම ප්‍රසම්පාදනයක් සම්බන්ධව ගිවිසුම් වලට එළඹීමේ ප්‍රායෝගික දුෂ්කර විය. ලංසු ප්‍රතිග්‍රහණය හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපි ගිවිසුම්ගත | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | බැඳීමක් පවතින ලියවිලි සේ පිළිගනු ඇත. | |
| (ආ) | අංක 01/2016 හා 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයෙහි 2.3 ඡේදය අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තරඟකාරී මිල ගණන් කැඳවිය යුතු වුවද 2018 මාර්තු 16 දින මෝටර් රථ 08 ක් සහ කැබ්රථ 02 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගැනීම සඳහා ලැබී තිබුණු එකම ලංසුව මත පදනම්ව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ඒ අනුව ඉදිරි වර්ෂ පහක් වෙනුවෙන් සිදුකල රු. 98,300,940 ක්වූ මෙම ගණුදෙනුව සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අපේක්ෂිත තරඟකාරී මිලගණන් ලබා ගැනීමකින් තොරව සිදුකර තිබුණි. | අදාළ අංශය වෙතින් මෙම නිරීක්ෂණය සඳහා වන කරුණු දැක්වීම් ඉදිරිපත් කල පසු කඩිනමින් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුයි |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 හි සඳහන් පරිදි, ලබාගන්නා ලංසු සුරක්ෂණයක් අවලංගු කළ නොහැකි අතර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කරනු ලබන ප්‍රථම ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්ථනය කළ හැකි විය යුතු වේ. එහෙත් ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ මුද්‍රණ යන්ත්‍ර 20 ක් හා පරිගණක යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම සඳහා වන ලංසු සුරක්ෂණය ලෙස රු.46,000 ක චෙක්පතක් ලබාගෙන තිබුණි. ලංසු සුරක්ෂණයක් ඉදිරිපත්කිරීම අවශ්‍ය බවට ලංසු ලේඛණවල දක්වා ඇති විටක එය ඉදිරිපත් නොකිරීම ප්‍රධාන බැහැරවීමක් ලෙස සලකා ලංසුව ප්‍රතික්ෂේප කල යුතු වුවද ලංසුව සමඟ ඉදිරිපත්කර තිබුණු රු.46,000 ක චෙක්පත ලංසු සුරක්ෂණයක් ලෙස සලකා එම ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | මෙම මිල ගණන් කැඳවීමට අනුව අවම ලංසු ඉදිරිපත් කල සැපයුම්කරු ඇණවුම විවෘත කරන අවස්ථාවේ දී ලංසු ඇපකරයක් වෙනුවට රු.46,000 ක වටිනාකමකින් යුක්ත චෙක්පතක් ලබාදෙන ලදී.<br><br>දෙවන මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය වෙතින් සිදු කලේ නම් රු.1,043,500 ක පාඩුවක් සිදු වන බැවින් ද වසංගත තත්ත්වය උපරිම මට්ටමක පැවති බැවින් ද පරිගණක මිල දී ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තක් ව පැවති බැවින් ද තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත රු.46,000 ක චෙක්පත ලංසු ඇපකරයක් ලෙස සලකා පරිගණක 11 ක් සහ මුද්‍රණ යන්ත්‍ර 08 ක් මිල දී ගැනීම සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුයි. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.5.1 ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනට අනුකූලව සහ ලංසු වලංගු කාල සීමාව තුලදී කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකල යුතු අතර එසේ නොවන අවස්ථාවක ලංසුවේ වලංගු කාලය සහ | සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝකර ගැනීමට 2022.04.24 දින ලංසුකරුවන් දැනුවත් කරන ලදී.<br>ඒ අනුව, ලංසු කරුවන් දෙදෙනෙකු ලංසු වලංගු කාලය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුයි. |

| | | |
|---|---|---|
| ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කරගැනීම කල යුතු වුවත් ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සපයා ස්ථාපනයකිරීම පිළිබඳ ප්‍රසම්පාදනයේ දී ලංසු වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය අවලංගුවී තිබුණද කාල දීර්ඝකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝකර ඇති අතර එක් ලංසුකරුවකු වලංගු කාලය පමනක් දීර්ඝකර ඇත. එක් ලංසු කරුවකු ලංසු වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කිරීමට නොහැකි බව දන්වා සිටින ලදී. | |

## 3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් මිලදීගනු ලබන ටෝනර් හා ලිපිද්‍රව්‍ය ඇතුළු පරිබෝජ්‍ය ද්‍රව්‍ය අයිතමයන්හි තොග ලැබීම්, තොග නිකුත් කිරීම් හා තොග ශේෂය දැක්වෙන පරිදි තොග පොත් විධිමත්ව පවත්වා නොතිබීම හා මනා අධීක්ෂණයක් පවත්වා නොතිබීම හේතුවෙන් කිසියම් දිනකට පවත්නා පොත් ශේෂය හා තත්‍ය ශේෂය අර්ථාන්විත සැසදීමකට ලක්කළ නොහැකි විය. එසේම පරිබෝජ්‍ය ද්‍රව්‍ය නිකුත් කිරීමේදී ඊට අදාල පාලන පිළිවෙත් අනුගමණය කර නොතිබීම හෝ නොසලකා හැරීම හේතුවෙන් සමාලෝචිත කාලය තුල සිදුකල තොග නිකුත් කිරීම් සනාථ කරගත නොහැකි විය. | ඉහත නිරීක්ෂණ 1.6 සඳහා ලබා දී ඇති කරුණු දැක්වීම්වල ද දක්වා ඇති පරිදි මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව සඳහන් කරමි. | තොගලේඛණ නිසි පරිදි නඩත්තු කල යුතුය. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 880 පරිදි ඇප තැබීමට අවශ්‍ය නිලධාරින් ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වන අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙළ කළ යුතු වුවද, යථෝක්ත ආඥා පනතෙහි කොන්දේසි යාවත්කාලීන ව නොපැවතීමත්, රජයේ මුදල්, බඩු බාහිරාදිය, දේපළ සම්බන්ධයෙන් වගකීම් දරණ හා රාජකාරි කරන | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කල යුතුය. |

නිලධාරින්ගේ නොසැලකිල්ල / අනවධානය / හිතා මතා සිදු කරන වංචා ආදිය හේතුවෙන් මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන හා අනෙකුත් චක්‍රලේඛ ආදිය උල්ලංඝනය කරන නිලධාරින්ට එරෙහිව කටයුතු කරන බැවින් සහ ඒ අනුව රජයට වී ඇති පාඩු පියවා ගැනීමට කටයුතු කරන බැවින් ඇප ලේඛනයක් පිළියෙල නොකරන ලදී.

3.6 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------- | ------------ |
| (අ) | 2014 වර්ෂයේදී සිදුව තිබුණු ගිනි ගැනීමක් හේතුවෙන් ත්‍රිවිධ හමුදා මූලස්ථාන ව්‍යාපෘතියට අයත් රු. 12,312,766 ක් වටිනා වත්කම් අලාභහානියට පත්ව තිබුණු අතර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීම හෝ පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවෙමින් පැවතුණි. | පොලිස් වාර්තාවට අනුව මෙම සිදුවීමට හේතු හඳුනා ගෙන නොමැති බැවින් හා සැකකරුවකු අත්අඩංගුවට ගෙන නොමැති අතර, මෙහි ප්‍රගතිය වාර්තා කරන තෙක් අධිකරණය මඟින් නඩුව බහා තබා ඇති බව අධ්‍යක්ෂ, ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය විසින් දැනුම් දී ඇත. ප්‍රගති සමාලෝචන වාර්තාවක් ගෙන්වා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | අලාභහානි සම්බන්ධව විධිමත් පරිදි කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ත්‍රිවිධ හමුදා මූලස්ථානය ව්‍යාපෘතියට අයත් රු.1,959,660 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් ගිනි ගැනීම පිළිබඳව පරීක්ෂණ මණ්ඩලයක් පත් කර මාස 6 කට අධික කාලයක් ගතවී ඇතත් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම අලාභය සිදුවී මාස 3ක් ඇතුලත පිළියෙල කල යුතු මු.රෙ.104(4) වාර්තාව ඉදිරිපත් කිරීමටද කටයුතු කර නොතිබුණු හෙයින් අලාභය සම්බන්ධව වගකිවයුතු පාර්ශව හඳුනාගැනීම ප්‍රමාද වෙමින් පැවතුණි. | මෙම සිදුවීම සම්බන්ධ වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන මූලික පරීක්ෂණ මණ්ඩල වාර්තාව අවසන් කර ඇති අතර, එය මු.රෙ 104 (4) වාර්තාව සමඟ නුදුරේ දී ම මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් දන්වා ඇත. තවද, මෙම විදුලි ජනක යන්ත්‍රයේ අලුත්වැඩියා වියදම ඇස්තමේන්තු කිරීම සඳහා මිල දී ගත් ආයතනය වෙත ඉදිරිපත් කර ඇති දන්වා ඇත. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කල යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාදයන් සහ ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදවීම් ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ගකිරීමට සිදුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් රු.1,126,141,457 ක් හා එක්සත් ජනපද ඩොලර් 1,606,201 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් (Claims for EOT) 24 ක් ඉල්ලුම් කර තිබුණි. | ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා නොදීම, 2015 හා 2016 වර්ෂයන් තුල ණයවර ලිපි සඳහා භාණ්ඩාගාර අනුමැතියන් ප්‍රමාද වී ලැබීම, ප්‍රසම්පාදන සඳහා කැබිනට් අනුමැතිය ප්‍රමාද වීම හා මිල ගණන් නැවත කැඳවීමට තීරණය වීම ආදී කරුණු හේතු වෙන් ව්‍යාපෘති ප්‍රගතිය ද මන්දගාමී විය. උක්ත කරුණු හේතු කොට ගෙන බාහිර කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යයන් හා සේවාවන් අපේක්ෂිත කාලය තුල නිම කිරීමට නොහැකි විය. එබැවින් කාලය දීර්ඝ කිරීම් ලබාදීමට සිදුවූ අතර දැරූ අතිරේක වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා කාලය දීර්ඝ කිරීමේ හිමිකම් ඉල්ලුම් කර ඇත. මෙම හිමිකම් පෑම් නැවත සමාලෝචනය කිරීම සඳහා ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) වෙත ඉදිරිපත් කර ඇත. | අනවශ්‍ය ප්‍රමාදයන් හේතුවෙන් ඇතිවන අතිරේඛ හිමිකම්පෑම් අවම කර ගැනීමත් අනාර්ථික වියදම් අවමකර ගැනීමටත් කටයුතු කළයුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ තනතුරු 79 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු 16 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් තනතුරක හා සංවර්ධන නිලධාරි තනතුරු 44 ක අතිරික්තයක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය සේවා, පලාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙතද, ඒකාබද්ධ සේවා තනතුරු පුරප්පාඩු පිළිබඳව ද ඒකාබද්ධ සේවා ජනරාල්වරයා වෙතද ඉල්ලීම් කර ඇත. අමාත්‍යාංශය වෙත පුහුණුවට යොමු | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පමණක් පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරන ලද උපාධිධාරී අභ්‍යාස ලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙස අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම හේතුවෙන් අතිරික්තයක් පෙන්නුම් කළ ද සේවා අවශ්‍යතා මත කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු පවතින තනතුරුවල සේවයේ යොදවා ඇත. | |
| (ආ) | ජාතික ශිෂ්‍යභට බලකායේ තනතුරු 68 ක් පුරප්පාඩුව පැවති අතර ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු පුරප්පාඩු හේතුවෙන් මූල්‍ය පාලන හා ආයතනික පරිපාලන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීම කෙරේ අහිතකරව බලපා තිබුණි. | ජාතික ශිෂ්‍යභට බලකායට අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ ගණකාධිකාරී හා වෛද්‍ය නිලධාරී තනතුරු 02 පුරප්පාඩුව පවතී. මෙම තනතුරු සඳහා තාවකාලිකව අනුයුක්ත නිලධාරීන් මගින් රාජකාරි ආවරණය කරනු ලබයි. තෘතීක මට්ටමේ පරිපාලන නිලධාරි සහ හෙද නිලධාරී තනතුරු 3 ක් පුරප්පාඩුව පවතී. | ප්‍රමානවත් කාර්යය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |